ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය

# මාර්ග සංවර්ධන අධිකාරිය

## ලංසු කැඳවීම

01.මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුවේ පොළොන්නරුව සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන කාර්යයන් සදහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| කොන්ත්‍රාත් අංකය | වැඩ විස්තරය | අවශ්‍ය ප්‍රමාණය | ලංසු ඇපකරය |
|---|---|---|---|
| RRD/PD(NCP) /POL/NP/21-24/AC/37 | පොළොන්නරුව විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් අරලගන්විල සිළුමිණි සෑය රජමහා විහාරස්ථාන අභ්‍යන්තර මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මාර්ග පාදම (Base) දැමීම සදහා අවශ්‍ය ABC (37.5 mm) සපයා ගැනීම. | 207 Cube | 65,000.00 |
| RRD/PD(NCP) /POL/NP/21-24/AC/37 | පොළොන්නරුව විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් අරලගන්විල සිළුමිණි සෑය රජමහා විහාරස්ථාන අභ්‍යන්තර මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මාර්ග උප පාදම (Sub Base) දැමීම සදහා අවශ්‍ය බොරළු සපයා ගැනීම. (CBR >30) | 250 Cube | 35,000.00 |
| RRD/PD(NCP) /POL/NP/21-24/AC/37 | පොළොන්නරුව විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් අරලගන්විල සිළුමිණි සෑය රජමහා විහාරස්ථාන අභ්‍යන්තර මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය සදහා අවශ්‍ය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ගල් සපයා ගැනීම. (200mmx110mmx80mm/40 N/mm$^2$ ) | 110000.0 Nos | 100,000.00 |

02. ලංසු තැබීම ජාතික තරගකාරී ලංසු තැබීමේ පටිපාටිය හරහා සිදු කෙරේ.

03.මෙ සඳහා උනන්දුවක් දක්වන ලංසු කරුවන් කාර්යාල වේලාවන් තුළ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, පොළොන්නරුව වෙතින් වැඩිදුර තොරතුරු ලබා ගත හැක. දුරකථන අංකය 027 - 2222052

04. රුපියල් 2,421.51 ක මුදලක් තැම්පත් කර 2024.05.15 දින සිට 2024.05.30. වන දින දක්වා අයදුම්පත් පොළොන්නරුව ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයෙන් ලබා ගත හැක. ලංසු ඉදිරිපත් කිරීමේදී එම මුදල් ගෙවා ලබා ගත් ලදුපත සමග ඉදිරිපත් කල යුතුය.මුදල් තැම්පතු පත්‍රිකාව නොමැතිව ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05.කාර්යාලයට පැමිණ මිළ කැඳවුම්පත් ලබා ගත නොහැකි සැපයුම්කරුවන් හට cepolonrda@gmail.com වෙත ඊ මේල් පණිවිඩයක් යොමු කිරීම මගින් අයදුම්පත් ගෙන්වා ගත හැකි අතර ඔවුන් එම මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මුදල් ගෙවා රිසිට්පතක් ලබා ගෙන එයද මිළ ගණන්පත් සමග ඉදිරිපත් කළ යුතුය.එසේ නොවන මිළ ගණන්පත් ප්‍රතික්ෂේප වේ.

06. ලංසුව ඉහත වගුවෙහි දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතු අතර, 2024.06.30 දින දක්වා එකී ලංසු ආරක්ෂණය වලංගු විය යුතුය. ලංසු ආරක්ෂණයක් නොමැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07.ලංසුකරු තෝරා ගැනීමෙන් පසු ඉංජිනේරුමය ද්‍රව්‍ය (ABC, බොරළු, කොන්ක්‍රීට් කුට්ටි ගල්) සැපයුම් ලබා ගන්නා අතර, එම සැපයුම්වලින් අහඹු ලෙස ලබා ගන්නා ද්‍රව්‍යවල ප්‍රමිතිය පරීක්ෂා කරනු ලබන අතර ඒ සඳහා යන වියදම් සැපයුම්කරු විසින් දැරිය යුතුය.

08.ලංසු කරුවන් විසින් මුද්‍රා තැබූ ලංසු ප්‍රධාන ඉංජිනේරු,මාර්ග සංවර්ධන අධිකාරිය, පොළොන්නරුව යන ලිපිනයට 2024.05.31 දින පෙ.ව. 11.00 පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දෙන ලෙස ඉල්ලා සිටිමි. ලියුම් කවරයේ වම්පස උඩ අදාළ කොන්ත්‍රාත්තුවේ නම (ඉහත පරිදි) පැහැදිළිව සඳහන් කළ යුතුය. ටෙන්ඩර් විවෘත කිරීමේ අවස්ථාවට ලංසුකරුවන් හෝ ඔහුගේ නියෝජිතයන් සහභාගි විය හැක.ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.


**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**මාර්ග සංවර්ධන අධිකාරිය,**
**පොළොන්නරුව.**
**027-2222052**